# ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ස්ථාපිත කිරීමේ දී ව්‍යවසායකයින් මුහුණ දෙන ගැටලු අධ්‍යයනය කිරීම

පී. ඩී. සමරසිංහ
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
pdsamarasingha.pds@gmail.com

කාර්මික විප්ලවයේ ආරම්භයත් සමඟ ආර්ථික ව්‍යුහය තුළ කර්මාන්ත අංශයේ වැදගත්කම ප්‍රචලිත වන්නට විය. සංවර්ධිත රටවල මෙන් ම සංවර්ධනය වෙමින් පවතින රටවල ද ආර්ථිකයට විශාල දායකත්වයක් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වලින් ලබා දේ. ලංකාවේ සමස්ත කර්මාන්තවලින් 75%ක් පමණ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වන අතර සමස්ත රැකියා අවස්ථාවන්ගෙන් 45%කට වඩා එම අංශයේ සේවා නියුක්ත වේ. එසේ ම දළ දේශීය නිෂ්පාදිතයෙන් 50%ක පමණ දායකත්වයක් ද සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලින් ලබාදෙන නිසා මෙම කර්මාන්ත ක්ෂේත්‍රය ශ්‍රී ලංකා ආර්ථිකයේ කොඳුනාරටිය ලෙස සැලකිය හැකි ය. මේ අනුව සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නඟාසිටුවීම රටේ සමස්ත ආර්ථික වර්ධනයට හා සංවර්ධනයට ඉවහල් වේ. ඒ අනුව ග්‍රාමීය ප්‍රදේශවල කර්මාන්ත ස්ථාපිත කිරීම, ග්‍රාමීය සංවර්ධනය සඳහා ඉතා වැදගත් වේ. නමුත් ග්‍රාමීය කුඩා ව්‍යවසායකයින්ට කර්මාන්ත ස්ථාපිත කිරීමේ දී විවිධ ගැටලුවලට මුහුණදීමට සිදු වේ. ඒ නිසා කුඩා කර්මාන්ත ස්ථාපිත කිරීමේ දී ග්‍රාමීය ව්‍යවසායකයන් මුහුණපාන ප්‍රධාන ගැටලු අධ්‍යයනය කිරීම, කාර්මික සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට ද ඉවහල් වේ. ඒ අනුව ග්‍රාමීය ප්‍රදේශවල කුඩා කර්මාන්තකරුවන් මුහුණදෙන ගැටලු හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ. ඒ සඳහා අධ්‍යයන ප්‍රදේශය ලෙස රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය ප්‍රදේශය තෝරාගත් අතර ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ලියාපදිංචි කුඩා කර්මාන්ත 60ක් අහඹු ලෙස තෝරාගැනුණි. කුඩා කර්මාන්තකරුවන්ට ලබාදුන් ප්‍රශ්නාවලියක් ඇසුරෙන් රැස් කරගත් ප්‍රාථමික දත්ත විශ්ලේෂණය කිරීම සිදු විය. අධ්‍යයනයට අනුව තෝරාගත් කුඩා කර්මාන්ත නියැදිය තුළ ග්‍රාමීය කුඩා කර්මාන්ත ස්ථානගත වීමේ දී පුද්ගලයන් මුහුණපාන ගැටලු ගණනාවක් හඳුනාගත හැකි විය. ග්‍රාමීය කුඩා කර්මාන්ත දිරිගැන්වීම සඳහා ආයතනික වශයෙන් ලබාදෙන සහයෝගය ඉතා අඩු මට්ටමක පැවතීම මෙම ප්‍රදේශවල කුඩා කර්මාන්තකරුවන් මුහුණදෙන ප්‍රධාන ගැටලුවක් විය. එසේ ම ලියාපදිංචි කිරීමේ ගැටලු, අපද්‍රව්‍ය කළමනාකරණ ගැටලු, ණය ලබාගැනීම අපහසු වීම ආදී ගැටලුවලට ද ග්‍රාමීය ව්‍යවසායකයන්ට මුහුණදීමට සිදු වී ඇත. නමුත් ග්‍රාමීය යන්ත්‍ර භාවිත කිරීමේ ගැටලුව හා ශ්‍රම හිඟය යන සංරෝධක එතරම් බලපෑමක් සහිත ගැටලු ලෙස ඉස්මතු වී නොමැති අතර ඊට හේතුන් ලෙස ග්‍රාමීය ප්‍රදේශවල අතිරික්ත ශ්‍රමයක් පැවතීම මෙන් ම අති බහුතරයක් වූ ග්‍රාමීය කුඩා කර්මාන්ත ශ්‍රම සූචක කර්මාන්ත වීම දැක්විය හැකි ය. එමෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල තවදුරටත් කර්මාන්ත ස්ථාපිත කිරීම සඳහා ඉහළ විභවතාවක් පවතින නමුත් කුඩා ව්‍යවසායකයන් මුහුණපාන සංරෝධකයන් පැවතීම බාධාකාරී වන අතර කර්මාන්ත ස්ථාපිත කිරීම ආකර්ෂණය සඳහා විවිධ ආයතනික සහයෝගයන් ලබා දීම, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, උපදේශන සේවා සැපයීම, සේවකයන්ට අවශ්‍ය පුහුණුව ලබාදීම, මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශ දියුණු කිරීම යනාදිය තුළින් කුඩා ව්‍යවසායකයන් මුහුණදෙන ගැටලු අවම කර ග්‍රාමීය අංශයේ ශ්‍රම සූචක කර්මාන්ත ස්ථාපිත කිරීම වඩාත් යෝග්‍ය වනු ඇත.

**ප්‍රමුඛපද:-** සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත; සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් මුහුණදෙන ගැටලු; කර්මාන්ත ස්ථානගත කිරීම; ප්‍රාදේශීය සංවර්ධනය